10

අපේ අංකය: සං/ප්‍රති/01

චක්‍රලේඛන අංක- 70

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,

අංක 70,පාර්ලිමේන්තුව පාර,

පැලවත්ත,බත්තරමුල්ල.

2012-02-29දින.

සියලුම ප්‍රාදේශීය කළමනාකරුවන් වෙත,

## තේ ඉඩම් හා ඉඩම් හිමියන් ලේඛණගත කිරීම

**පසුබිම :**

1957 අංක 51 දරණ තේ පාලන පනත යටතේ ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ කොමසාරිස් අංශය විසින් ආසන්න වශයෙන් 1990 වසර දක්වා පමණ පවත්වාගෙන ගිය තේ ඉඩම් සහ ඉඩම් හිමියන් ලියාපදිංචි කිරීමේ වැඩසටහන කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ක්‍රියාත්මක කළ යුතු බවට වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් ලබාදී ඇති උපදෙස් අනුව, තේ පාලන පනත යටතේම වර්ගීකරණය කර ඇති පරිදි අක්කර 10 දක්වා වන ( අක්කර 10ට වඩා අඩු)කුඩා තේ වතු හිමියන් ලේඛණගත කිරීම මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මගින් අපේක්ෂා කෙරේ.

**අරමුණ:**

තේ පාලන පනත යටතේ කුඩා තේවතු සහ කුඩා තේවතු හිමියන් වශයෙන් අර්ථකථනය අනුව, අක්කර 10 දක්වා වන කුඩා තේ වතු සහ ඒවායේ හිමිකරුවන් ලේඛණගත කිරීම සහ එම තොරතුරු ඇතුළත් දත්ත පද්ධතියක් පවත්වාගෙන යාම.

**වගකීම :**

තම ප්‍රාදේශීය බල ප්‍රදේශයට අයත් සියළු කුඩා තේවතු හිමියන් හා එම ඉඩම් පිළිබද ලේඛන ගත කිරීම ප්‍රාදේශීය කළමනාකරුගේ වගකීම වන අතර, ඔහු ඒ සදහා අධීක්ෂක තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් හා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් මෙහෙය විය යුතුය.

සුදුසු පරිදි ප්‍රචාරාත්මක ක්‍රමවේදයක් අනුගමනය කිරීමෙන් පසුව කුඩා තේවතු සංවර්ධන සමිති පාදක කරගත් භූගෝලීය ප්‍රදේශවල කුඩා තේවතු හිමියන් විසින් ඉදිරිපත් කෙරෙන ලේඛනගත කිරීමේ ඉල්ලුම්පත් අදාල සමිතියේ බලය පැවරෙන අයකුහෝ කීපදෙනෙකු විසින් පරීක්ෂා කිරීමෙන් පසුව ඉල්ලුම්පත්‍ර නිර්දේශ කරනු ලැබිය යුතුය.

එම ඉල්ලුම්පත්‍ර නිර්දේශ කිරීමේදී ඉල්ලුම්පත්‍රවල අන්තර්ගත තොරතුරුවල නිවැරදිතාවය ඉල්ලුම්පත්‍ර නිර්දේශ කිරීමේ වගකීම දරන්නන් විසින් සෑහීමකට පත්වී කළයුතු අතර, ඉඩම්වල අයිතියේ ස්වභාවය සටහන් කිරීමේදී අදාල බලපත්‍රය හෝ අවසරපත්‍රය පරීක්ෂා කිරීම හා පසුගිය වසරේ දළු අස්වනු ප්‍රමාණය තහවුරු කිරීම සදහා අවශ්‍යවේ නම්, දළු නිෂ්පාදනයේ තොරතුරුද පරිශීලනය කිරීමට වගබලා ගතයුතුය.

තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් විසින් සමිති විසින් නිර්දේශකරන ඉල්ලුම්පත්‍ර සහතික කර ප්‍රාදේශීය කර්යාලය වෙත ඉදිරිපත් කල යුතුය.

ප්‍රාදේශීය කාර්යාලයට ලැබෙන නිර්දේශිත ප්‍රකාශනවල තොරතුරු ඒ සඳහා පිළියෙල කරනලද දත්ත පද්ධතියකට ඇතුළත් කිරීම ප්‍රාදේශීය කාර්යාලයේ එම කොට්ඨාශය බාරව කටයුතු කරන කළමණාකරන සහකාර මගින් සිදුකල යුතුය.

තම කොට්ඨාශයේ සියළු ඉඩම් ලේඛනගත කරගැනීමේ වගකීම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් දැරිය යුතු අතර, ඒ පිලිබඳ අධීක්ෂණය කිරීමේ වගකීම අධීක්ෂක තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් වෙත පැවරේ.

**ක්‍රමවේදය :**

කුඩා තේවතු හිමියන්ගෙන් ලබාගන්නා තමන්ගේ ඉඩම පිළිබඳ තොරතුරු ඇතුළත් ස්වයං ප්‍රකාශනය එම තේ ඉඩම පිහිටි ප්‍රදේශයේ කුඩා තේවතු සංවර්ධන සමිතිය මගින් කරනු ලබන නිර්දේශයකින් අනතුරුව ප්‍රදේශයේ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී වෙත බාරදෙනු ලැබේ.(ඉල්ලුම්පත්‍රය/ස්වයං ප්‍රකාශනය අමුණා ඇත)

අදාල කුඩා තේවතු සංවර්ධන සමිතිය විසින් මෙම කාර්ය සඳහා පත්කර ගනු ලබන අයෙකු හෝ කිහිපදෙනෙකුගෙන් සැදුම්ලත් කමිටුවක් මගින් ඉදිරිපත් කරනු ලබන ස්වයංප්‍රකාශන පරීක්ෂාකර බලා අවශ්‍ය අවස්ථාවකදී ලිඛිත සාක්ෂිද කැඳවා එම ඉල්ලුම්පත්‍රයේ සමිති නිර්දේශයද සහිතව ප්‍රදේශයේ තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී වෙත දෙසතියකට වරක් භාරදිය යුතුය.

තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් මෙම ඉල්ලුම්පත්‍රය පිළිබඳව සෑහීමකට පත්වීමෙන් අනතුරුව කුඩා තේ ඉඩම් ලියාපදිංචි කිරීම පිලිබඳව ඔහුගේ සහතිකය සහිතව ප්‍රාදේශීය කාර්යාලයට බාරදිය යුතුය.

තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීගේ නිර්දේශය ලබාදීමේදී ඔහුට හෝ ඇයට එකග නොවිය හැකි තොරතුරු වාර්තා වුවහොත් එම ඉල්ලුම්පත්‍රය අදාල සමිතිය වෙත නැවත නිවැරදි කර ඉදිරිපත් කිරීම සඳහා ආපසු බාරදිය යුතුය.

මෙම තොරතුරු දත්ත පද්ධතියට ඇතුළත් කර අවශ්‍ය වේලාවන්හිදී වාර්තා වශයෙන් ලබාගැනීමට හැකි පහසුකම් සලස්වනු ලබන අතර මාස 06 ක් තුලදී මෙම ක්‍රියාවලිය අවසන් කිරීමට කටයුතු කල යුතුය.

සමිති බල ප්‍රදේශවලින් ආවරනය නොවන කුඩා තේවතු හිමියන් විසින් ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශයන් තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී විසින් සෘජුවම නිර්දේශකර අධීක්ෂක තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීගේ සහතිකය සහිතව ප්‍රාදේශීය කාර්යාලය වෙත බාරදිය යුතුය.

<u>වෙනත් කරුණු:</u>

කුඩා තේවතු ලියාපදිංචි කිරීමේදී එම ඉඩමේ අයිතිය ලිඛිත තොරතුරු මගින් සනාථ කරවා ගැනීම අවශ්‍ය අවස්ථාවන්වලදී සිදුකලයුතු අතර, එම තොරතුරු අනුව අයිතියේ ස්වභාවය තීරණය කළයුතුය.

එක් ඉඩමක් කොටස් වශයෙන් කිහිපදෙනෙකු නමින් ලේඛණගත කිරීම පිටුදැකීම මෙයින් අපේක්ෂා කෙරේ.

කුඩා තේ ඉඩමක් ලෙස පර්:20 සිට අක්කර 10 දක්වා(හෙක්:.1012 සිට හෙක්:4.047) වන බිම් ප්‍රමාණයක් ලේඛණගත කිරීමට අපේක්ෂා කෙරේ.

කිසියම් කුඩා තේ ඉඩමක වයස සඳහන් කිරීමේදී එම ඉඩමේ අඩකට වැඩියෙන් ඇති වගාව අනුව එම තොරතුරු ඇතුළත් කළ යුතුය.

බීජ තේ වගා බිම් ප්‍රමාණයන් වෙන් වශයෙන් සඳහන් කළයුතුය.

<u>ක්‍රියාත්මක කිරීම:</u>

මේ සඳහා අදාල පුහුණු කිරීම් සිදු කරන අතර ප්‍රාදේශීය කළමනාකරුවන් හා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීම ප්‍රධාන කාර්යාලය විසින් සිදු කරනු ලබන අතර සමිති නිලධාරීන් පුහුණු කිරීම ප්‍රාදේශීය කළමනාකරුවන් හා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්ගේ මූලිකත්වයෙන් උප කාර්යාල මට්ටමින් පැවැත්විය යුතුය. ඒ සඳහා ප්‍රදේශයේ ඉඩම් කටයුතු පිළිබඳ ප්‍රවීනත්වයක් ඇති බාහිර පාර්ශවයක සම්පත් දායකයෙකු දායක කරගැනීමද සුදුසු වේ.

<u>කාලරාමුව:</u>

සමස්ථ ක්‍රියාවලිය 2012 වසර තුල සම්පූර්ණ කිරීමට ඉඩසැලසෙන පරිදි තෙමසක කාලයක් තුල කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමට සහ කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති නිලධාරී වෙත බාරදීමට ඉඩකඩ සලසනු ලැබේ.

නොඑල් පද්මසිරි කරියවසම්

සභාපති

පිටපත්:

1. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(සංවර්ධන/ව්‍යාප්ති)
2. සහකාර සාමාන්‍යාධිකාරී(සංවර්ධන/පරිපාලන/සේවා)
3. අභ්‍යන්තර විගණක
4. මුදල් කළමණාකරු
5. කළමණාකරු(සැලසුම් හා නියමුකරණ/ප්‍රජා සංවර්ධන)
6. සියළුම මාණ්ඩලික නිලධාරීන්
7. සියළුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්
8. ගරු සභාපති/ගරු ලේකම්, සමස්ත ලංකා සමිති සංවිධානය
9. සියළුම ප්‍රාදේශීය සංවිධානවල ගරු සභාපති/ලේකම්

# කුඩා තේ ඉඩම් ලේඛණ ගතකිරීමේ අයදුම් පත්‍රය.

(කුඩා තේ ඉඩමේ නීත්‍යානුකූල හිමිකරු විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් අයදුම් කළ යුතුය.)

1. ඉඩමේ නම:..........................................................................................................
   පිහිටි දිස්ත්‍රික්කය:............................ ප්‍රා.ලේකම් කොට්ඨාශය:....................................
   ග්‍රාමසේවා වසම:............................... ගම: .........................................................
2. ඉඩම් හිමිකරුගේ නම:.............................................................................................
3. හැඳුණුම්පත් අංකය:.................................... දුරකථන අංකය:........................................
4. ලිපිනය: .................................................................................................................
   ..........................................................................................................................
5. තේ බිම් ප්‍රමාණය:
   i. රිකිලි තේ: ...................
   ii. ඇට තේ : ...................
   (වගාව පිහිටුවා ඇති රෝපණ ක්‍රමය අනුව සටහන් කළයුතුය.)
6. වගාවේ වයස:............................................
7. ප්‍රකාශ කරන තැනැත්තා හිමිකරු නොවේනම් ඔහුගේ/ඇයගේ නම සහ ඉඩමේ හිමිකරුට ඇති සබන්ධතාවය:...............................................................................................
   ..........................................................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමින් කුඩා තේ ඉඩමක් ලෙස ලේඛණගත කරන ලෙසට ඉල්ලා සිටිමි.

.................................................

දිනය:........................ අයදුම්කරු

---

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට නිර්දේශ කරමි.

..........................................................................

දිනය:................................ බලයලත් නියෝජිත/කුඩාතේ වතු සංවර්ධන සමිතිය

---

ඉල්ලුම්පතෙහි දක්වා ඇති තොරතුරු සත්‍ය බැවින් කුඩා තේ ඉඩමක් ලෙස ලේඛණ ගත කිරිම නිර්දේශ කරමි.

.............................................................

දිනය: ................................. තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී

වෙනත් කරුණු:

කුඩා තේවතු ලියාපදිංචි කිරීමේදී එම ඉඩමේ අයිතිය ලිඛිත තොරතුරු මගින් සනාථ කරවා ගැනීම අවශ්‍ය අවස්ථාවන්වලදී සිදුකලයුතු අතර, එම තොරතුරු අනුව අයිතියේ ස්වභාවය තිරණය කළයුතුය.

එක් ඉඩමක් කොටස් වශයෙන් කිහිපදෙනෙකු නමින් ලේඛණගත කිරීම පිටුදැකීම මෙයින් අපේක්ෂා කෙරේ.

කුඩා තේ ඉඩමක් ලෙස පර්:20 සිට අක්කර 10 දක්වා(හෙක්:.1012 සිට හෙක්:4.047) වන බිම් ප්‍රමාණයක් ලේඛණගත කිරීමට අපේක්ෂා කෙරේ.

කිසියම් කුඩා තේ ඉඩමක වයස සඳහන් කිරීමේදී එම ඉඩමේ අඩකට වැඩියෙන් ඇති වගාව අනුව එම තොරතුරු ඇතුළත් කළ යුතුය.

බීජ තේ වගා බිම් ප්‍රමාණයන් වෙන් වශයෙන් සඳහන් කළයුතුය.

ක්‍රියාත්මක කිරීම:

මේ සඳහා අදාල පුහුණු කිරීම් සිදු කරන අතර ප්‍රාදේශීය කළමනාකරුවන් හා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් පුහුණු කිරීම ප්‍රධාන කාර්යාලය විසින් සිදු කරනු ලබන අතර සමිති නිලධාරීන් පුහුණු කිරීම ප්‍රාදේශීය කළමනාකරුවන් හා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්ගේ මූලිකත්වයෙන් උප කාර්යාල මට්ටමින් පැවැත්විය යුතුය. ඒ සඳහා ප්‍රදේශයේ ඉඩම් කටයුතු පිළිබඳ ප්‍රවීනත්වයක් ඇති බාහිර පාර්ශවයක සම්පත් දායකයෙකු දායක කරගැනීමද සුදුසු වේ.

කාලරාමුව:

සමස්ථ ක්‍රියාවලිය 2012 වසර තුල සම්පූර්ණ කිරීමට ඉඩසැලසෙන පරිදි තෙමසක කාලයක් තුල කුඩා තේ වතු හිමියන්ගේ ප්‍රකාශනයක් ඉදිරිපත් කිරීමට සහ කුඩා තේවතු සංවර්ධන අධිකාරියේ ව්‍යාප්ති නිලධාරී වෙත බාරදීමට ඉඩකඩ සලසනු ලැබේ.

නොඑල් පද්මසිරි කරියවසම්

සභාපති

28/02/12

# කුඩා තේ ඉඩම් ලේඛණ ගතකිරීමේ අයදුම් පත්‍රය.

( කුඩා තේ ඉඩමේ නිත්‍යානුකූල හිමිකරු විසින් හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් අයදුම් කළයුතුය. අක්කර 10 (හෙක්:4.047) ට අඩු සෑම ඉඩමක් වෙනුවෙන්ම එක් අයදුම්පතක් ඉදිරිපත් කළයුතුය)

1. ඉඩමේ නම:..........................................................................................................
   පිහිටි දිස්ත්‍රික්කය:........................................ ප්‍රා.ලේකම් කොට්ඨාශය:..............................
   ග්‍රාමසේවා වසම:........................................ ගම: ..............................................
2. ඉඩම් හිමිකරුගේ සම්පූර්ණ නම:..........................................................................
   ..........................................................................................
3. හැදුනුම්පත් අංකය:........................................ දුරකථන අංකය:..................................
4. ලිපිනය: ..........................................................................................................
   ..........................................................................................................
5. පවුලේ සාමාජික සංඛ්‍යාව(ඔබ ඇතුළුව):...................................
6. ඉඩමට අයත් මුළු බිම් ප්‍රමාණය : අක්:............රූඩ්............පර්:............
7. තේ වගාකර ඇති බිම් ප්‍රමාණය සහ වගාවේ වයස

| තේ වගාව | බිම් ප්‍රමාණය | | | වගාවේ වයස* |
|---|---|---|---|---|
| | අක්: | රූඩ් | පර්: | අවුරුදු |
| i. රිකිලි තේ | | | | |
| ii. ඇට තේ | | | | |

8. වගාව සඳහා කුලී ශ්‍රමය යොදා ගන්නේ නම් ශ්‍රමිකයන් සංඛ්‍යාව:...................................
9. ප්‍රකාශ කරන තැනැත්තා හිමිකරු නොවේනම් ඔහුගේ/ඇයගේ නම සහ ඉඩමේ හිමිකරුට ඇති සම්බන්ධතාවය:..........................................................................
   ..........................................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවට සහතික කරමින් කුඩා තේ ඉඩමක් ලෙස ලේඛණගත කරන ලෙසට ඉල්ලා සිටිමි.

..........................................
අයදුම්කරු

දිනය:.......................

---

ඉහත තොරතුරු සත්‍ය හා නිවැරදි බවට නිර්දේශ කරමි.

..........................................
බලයලත් නියෝජිත/කුඩාතේ වතු සංවර්ධන සමිතිය

දිනය:..............................

---

ඉල්ලුම්පතෙහි දක්වා ඇති තොරතුරු සත්‍ය බැවින් කුඩා තේ ඉඩමක් ලෙස ලේඛණ ගත කිරිම නිර්දේශ කරමි.

..........................................
තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී

දිනය: ..............................

## යෝජිත කුඩා තේ වතු හා ඒවායේ හිමිකරුවන්

## ලේඛණගත කිරීමේ කාලරාමුව

| | ක්‍රියාවලිය | 2012 මාර්තු | 2012 අප්‍රේල් | 2012 මැයි | 2012 ජුනි | 2012 ජූලි | 2012 අගෝස්තු | 2012 සැප්තැම්බර් | ඔක්තෝබර් | නොවැම්බර් |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | මාධ්‍ය ප්‍රචාරණය | | | | | | | | | |
| 2 | කුඩා තේ වතු හිමියන් හා ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත් කිරීම | | | | | | | | | |
| 3 | ක්ෂේත්‍ර නිලධාරීන් පුහුණුව | | | | | | | | | |
| 4 | ආකෘතිපත්‍ර පෙර පරීක්ෂාවන් සිදුකිරීම | | | | | | | | | |
| 5 | පරිගණක මෘදුකාංග සැකසීම | | | | | | | | | |
| 6 | අයදුම්පත්, හා අදාල තොරතුරු ලේඛණ සැකසීම | | | | | | | | | |
| 7 | සමිති නිලධාරීන් පුහුණුව | | | | | | | | | |
| 8 | අදාල පත්‍රිකා හා ලේඛණ බෙදාහැරීම | | | | | | | | | |
| 9 | තොරතුරු රැස්කිරීම හා ක්‍රියාත්මක කිරීම | | | | | | | | | |
| 10 | ලියාපදිංචි සටහන්පත්‍රිකා නිකුත් කිරීම | | | | | | | | | |
| 11 | කුඩා තේ වතු හිමියන්ගේ නාමලේඛණය සැකසීම | | | | | | | | | |